# සාරිපුත්ත මහරහතන් වහන්සේට
## වන්දනා කිරීම....

යෝ ධම්මසේනාපතී සුපූජිතෝ - පඤ්ඤාය පාරමිං ගතෝ
ගම්භීරපඤ්ඤෝ මේධාවී - මග්ගාමග්ගස්ස කෝවිදෝ
තං වීතරාගං සුසමාහිතින්ද්‍රියං - වන්දාමි පරිනිබ්බුත සාරිපුත්තං



"මහා අගසව් රහත් උතුමෙක් - සුපූජිත වූ දහම් සෙනෙවිව
මුදුන්පත් වී මහා ප්‍රඥාවෙන් - ගැඹුරු නුවණින් මහා නුවණින්
මග නොමග නිසි ලෙස දකින්නට - මහා දස්කම් පෑවෙද
ඒ වීතරාගී සමාහිත ඉඳුරන් ඇති - අමා නිවනට වැඩිය අපගේ
උතුම් සැරියුත් රහත් මුනිඳුට - වඳිමි මම සාදරයෙන්"

# මහා මොග්ගල්ලාන මහරහතන් වහන්සේට

## වන්දනා කිරීම....

යෝ මහානුභාවෝ ඡළභිඤ්ඤෙදෝ - ඉද්ධියා පාරමිං ගතෝ
සෝ විකුබ්බනාසු කුසලෝ - වසීභූතෝ මහිද්ධියා
තං වීතරාගං සුසමාහිතින්ද්‍රියං - වන්දාමි පරිනිබ්බුත මොග්ගල්ලානං



" මහා අගසව් රහත් උතුමෙක් - සයක් වූ මහ අභිඥා ලැබ
මුදුන්පත් වී ඉර්ධි බලයෙන් - මහා අනුහස් පෑවෙද
දක්ෂ වී මහා පෙළහරෙහි - ඉර්ධි බල තම වසඟයට ගත්
ඒ වීතරාගී සමාහිත ඉඳුරන් ඇති - අමා නිවනට වැඩිය අපගේ
මහා මුගලන් රහත් මුනිඳුට - වඳිමි මම සාදරයෙන් "

# මහා කස්සප මහරහතන් වහන්සේට

## වන්දනා කිරීම....

යෝ දායාදෝ බුද්ධසෙට්ඨස්ස - විසිට්ඨෝ ධුතගුණේ මුනී
උපසන්තෝ උපරතෝ - පන්තසේනාසනෝ විදූ
තං වීතරාගං සුසමාහිතින්ද්‍රියං - වන්දාමි පරිනිබ්බුත මහා කස්සපං



“ බුදුරජුන්ගේ උතුම් දායාදය වූ - යම් මහරහත් උතුමෙක්
අග්‍ර වී සීල ධුත ගුණෙන් - සංසිඳී නිකෙලෙස් වී
දුර ඈත වන අරණෙ වැඩහිඳ - දෙව් මිනිස්නට සැපත සැදුවෙද
ඒ විතරාගී සමාහිත ඉඳුරන් ඇති - පිරිනිවන් වැඩි අපගේ
මහාකස්සප රහත් මුනිඳුට - වඳිමි මම සාදරයෙන් ”

# ආනන්ද මහරහතන් වහන්සේට වන්දනා කිරීම....

යෝ චිත්තකථී ධම්මධරෝ - සතිමතෝ ගතිධිතීමතෝ
සුගතස්ස කෝසාරක්ඛකෝ - පූජනීයෝ බහුස්සුතෝ
තං වීතරාගං සුසමාහිතින්ද්‍රියං - වන්දාමි පරිනිබ්බුතානන්දත්ථේරං



"අප සුගත් සම්බුදු රජුන්ගේ - මහා දම්කඳ රැකගෙන
සොඳුරු බණපද පවසන - විස්මිත මතක බල ඇති
මනා සිහි ඇති මහා නුවණැති - සුපූජිත බහුශ්‍රැත වූ
ඒ වීතරාගී සමාහිත ඉඳුරන් ඇති - අමා නිවනට වැඩිය අපගේ
උතුම් අරහත් අනඳ මුනිඳුට - වඳිමි මම සාදරයෙන්"

# අංගුලිමාල මහරහතන් වහන්සේට
## වන්දනා කිරීම....

යෝ ච පුබ්බේ පමජ්ජිත්වා - අංගුලිමාලෝති විස්සුතෝ
අප්පමාදං සමාදාය - වීතතණ්හෝ සුසංවුතෝ
තං කාරුණිකං සුසමාහිතින්ද්‍රියං - වන්දාමි පරිනිබ්බුතංගුලිමාලං



"පෙර යමෙක් පමා වීමෙන් - අඟුල්මල් සේ ප්‍රකට වූයෙද
නොපමාව බුදු සසුනෙහි - නිකෙලෙස් ව රහත් වූයෙද
සියලු තණ්හාවෙන් මිදී ගොස් - හොඳින් සංවර වූයෙද
ඒ කාරුණික සමාහිත ඉඳුරන් ඇති - අමා නිවනට වැඩිය අපගේ
අඟුල්මල් රහත් මුනිඳුට - වඳිමි මම සාදරයෙන්"

www.mahamevnawa.lk

# මිහිඳු මහරහතන් වහන්සේට
## වන්දනා කිරීම....

**යෝ සත්ථුකප්පෝ කල්‍යාණමිත්තෝ - මහාඤාණී ජිනත්‍රජෝ**
**සෝ ලංකාදීපමාගම්ම - ජෝතයී බුද්ධසාසනං**
**තං වීතරාගං ලංකාදීපප්පසාදකං - වන්දාමි පරිනිබ්බුත මහා මහින්දං**



"උතුම් සම්බුදු පුත් රුවන වූ - අපට අනුබුදු රුවන බඳු වූ
මහා නුවණැති කලණ මිත් වූ - යම් මහරහත් උතුමෙක්
දඹදිවින් මෙහි වැඩම කොට - බුදු සසුන බැබළවූවෙද
මුළු ලක්දිව ම පැහැදුණු - වීතරාගිව පිරිනිවන් වැඩි
අපගේ මිහිඳු මුනිඳුට - වඳිමි මම සාදරයෙන්"